# මහර ප්‍රාදේශීය සභාව

# ගම්පහ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 04 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 පෙබරවාරි 05 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මහර ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2003 වර්ෂයේදී සභාවට පැවරී තිබුණු අක්කර 4 රූඩ් 1 පර්.8.26 ක්වූ ඉඩම් කැබලි 09 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) තොග සමීක්ෂණයකින් තොරව ගිණුම්ගත කර තිබූ රු.3,734,298 ක සමාලෝචිත වර්ෂය අවසානයට වූ තොගය, තොග පොත්වල ශේෂ ගණනය කර ගෙන ලබා ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් රු.1,478,946 ක සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සළසා නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොකිරීම නිසා එකතුව රු.91,546,354 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්

2007 වර්ෂයේ සිට ඉදිරියට ගෙනවිත් තිබෙන අවිනිශ්චිත ගිණුමේ රු.45,570 ක හර ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු (ණයගැති) ශේෂ 10 ක් සඳහා එකතුව රු.3,036,278 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 ට වර්ෂයකට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් තිබෙන නිලධාරි/ සේවක 26 දෙනෙකුගේ හිඟ හිටි සේවක ණය රු.173,469 ක් විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,625,413 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මව ආදායම රු. රු.32,429,299 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| i. | වරිපනම් හා බදු | 8,225 | 6,929 | 9,618 |
| ii. | බදු කුලී | 1,501 | 1,210 | 416 |
| iii. | බලපත්‍ර ගාස්තු | 4,394 | 765 | 153 |
| iv. | වෙනත් ආදායම් | 2,231 | 3,264 | 1,659 |

#### 2.2.2 වරිපනම් හා බදු

හිඟහිටි වරිපනම් බදු රු.9,618,256 ක්වූ අතර මහර හා නාරංවල උප කාර්යාල බල ප්‍රදේශවල රු.10,000 ඉක්මවූ ශේෂ වල එකතු අගය පිළිවලින්රු.1,101,310 හා රු.355,962 ක් විය. මෙම ශේෂවල ඇතැම් ඒවා වසර 01 සිට වසර 15 දක්වාකාලයක සිට හිඟව තිබුණි. එසේ වුවද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1)වගන්තිය ප්‍රකාර නීතිමය කියා මාර්ග මගින් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඇ) වත්කම් කළමනාකරණය